**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka


2025.05.11

**විදුලි ගාස්තු වැඩි කරමින් ජනතාව පීඩාවට පත් කිරීම වහාම නතර කරන්න.**

ඉදිරියට නියමිත විදුලි ගාස්තු සංශෝධනයේදී 25% ත් 30% අතර ප්‍රමාණයකින් විදුලි ගාස්තු වැඩි කිරීමකට රජය දරණ උත්සාහය වහාම නතර කරන ලෙස අප අවධාරණය කර සිටින්නෙමු.

වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ප්‍රමුඛ රජය බලයට පත්වීමට පෙර මෙරට ණය තිරසරකරණ විශ්ලේෂණය (DSA) යළි සමාලෝචනය කරන බවට ජනතාවට දුන් පොරොන්දුව අමතක කරමින්, පෙර පැවති රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ ඇති කරගත් එකඟතා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට යාමේ ප්‍රතිඵල ලෙස මෙලෙස විදුලි ගාස්තු වැඩි කිරීමකට රජය යොමු වීමේ තත්ත්වයක් නිර්මාණය වී තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ජූලි මාසයේ පැවැත්වීමට නියමිත සමාලෝචනයට පෙර විදුලි ගාස්තු වැඩි කරමින් කොන්දේසි සම්පූර්ණ කිරීමේ මෙහෙයුමක රජය නිරතව සිටින බව දැන් මනාව පැහැදිලි වේ.

පසුගිය වසරේ ලාභ ඉපැයූ ලංකා විදුලි බල මණ්ඩලය පෙබරවාරි මාසයේ සිට පාඩු ලබන බවත්, එය සංඛ්‍යාත්මකව රු බිලියන 271.1 පමණ වන බවත් පවසමින් මේ සැරසෙන්නේ එදා ජනතාවට දුන් පොරොන්දු කුණු කූඩයට දැමීමට බව හොඳින්ම පෙනෙන්නට තිබේ.

රු 9000 විදුලි බිල රුපියල් 6000 දක්වාත්, රුපියල් 3000 විදුලි බිල රුපියල් 2000 දක්වාත් 33% අඩු කරන බවට, වත්මන් ජනාධිපතිවරයා මැතිවරණයට පෙර ජනතාවට දුන් පොරොන්දුව අමතක කරමින්, මේ ආකාරයෙන් රටේ ජනතාව පීඩාවට පත් කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක් බව අප අවධාරණය කර සිටින්නෙමු.

මීට පෙරද වත්මන් විදුලි බල අමාත්‍යවරයා ප්‍රමුඛ රජය විදුලි ගාස්තු අඩු කිරීමේ හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරද්දීත්, විපක්ෂය ලෙස අපත්, විදුලි පාරිභෝගික සංවිධානත් නැඟූ හඬට ප්‍රතිචාර දක්වමින් මහජන උපයෝගීතා කොමිසම ජනවාරි මාසයේදී 20% කින් විදුලි ගාස්තු අඩු කිරීමට කටයුතු කළ ආකාරයද සිහිපත් කරනු කැමැත්තෙමි.

ඒ අනුව මෙවරත් විදුලි ගාස්තු වැඩි කිරීමකට එරෙහිව සියල්ලන් පෙළ ගස්වමින් මේ රටේ විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිය සුරක්ෂිත කිරීමට කැපවන බව අවධාරණය කර සිටිමි.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක.


අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com